# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1935/47 - 2015 ඔක්තෝබර් මස 09 වැනි සිකුරාදා - 2015.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය.: KDS/HAR/4/2/1/35.
ඉඩම් අමා. යොමු අංකය. 4/3/9/2013/WS/426.

මහනුවර හා තදාසන්න ජල සම්පාදන ව්‍යාපෘතියේ මැදවල නව සේවා ජලාශයේ සිට හැඳෙනිය දක්වා බෙදාහැරීමේ නල මාර්ග එලීම සඳහා ඉඩම් අත්කර ගැනීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැදසිය පත්තුව සුළු කොට්ඨාසයේ මැදවල ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික් ජේෂ්ඨ මැනුම් අධිකාරි විසින් මැන පිළියෙල කරන ලද අංක මු.පි.මහ/6423 දරන මූලික පිඹුරේ දැක්වෙන හෙක්ටයාර් 0.0632 ක් පමණ වූ ඉඩම් කැබලි 02.

**01.කැබලි අංක 01**

ඉඩමේ නම: ගල්වැටේහේන; හිමිකම් කියන අය : එච්. එම්. සෝමරත්න බණ්ඩා, අංක 245, හෙනේගම, මැදවල, හාරිස්පත්තුව; ප්‍රමාණය : හෙක්. 0.0308.

**02.කැබලි අංක 02**

ඉඩමේ නම: ගල්වැටේහේන; හිමිකම් කියන අය : එච්. එම්. සෝමරත්න බණ්ඩා, අංක 245, හෙනේගම, මැදවල, හාරිස්පත්තුව; ප්‍රමාණය : හෙක්. 0.0324.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015 නොවැම්බර් මස 27 වැනි දින පෙ.ව. 10.00ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2015 නොවැම්බර් මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ආර්. එම්. පී. එස්. බී. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2015 ඔක්තෝබර් මස 06 වැනි දින,
නුගවෙල, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-929


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G—022448 - 21 - (2015/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.